**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (ඈ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ වටිනාකම රු. 19,407,606 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව. | අදාල වත්කම්වල පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද යන්ත්‍ර හා ලී බඩු වටිනාකම රු. 299,369 ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය තුළ ගැලපීම් කර නොතිබුණි. | ඉදිරි වර්යේ දී අවසන් ගිණුම සැකසීම්දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම් සහ වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2022 වර්ෂයට අදාල උපචිත ණය වාරික මුදල සහ පොලී වටිනාකම එකතුව රු. 7,776,765 ක් ජංගම නොවන වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්යේ අවසන් ගිණුම සැකසීම්දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ජංගම හා ජංගම නොවන ණයහිමි නිසි පරිදි ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 2020 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.4.1 (අ) යටතේ පෙන්වා දී තිබූ ගිණුම්කරණ අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පෙන්වා දි ඇති ගිණුම්කරණ අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,051,853 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 553,741 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ ආයතන 17 | ආදායම් පරීක්ෂකවරයෙකු නොමැති වීම නිසා වරිපනම් | සභාවට ලැබිය යුතු ආදායම් අප්‍රමාදව |

| | | |
|---|---|---|
| ක රු. 69,814 ක හිඟ ශේෂයක් හා පෞද්ගලික ඒකක 697 කින් රු. 2,563,043 ක් වශයෙන් වරිපනම් ඒකක 714 කට අදාලව රු. 2,632,857 ක හිඟයක් පැවතුණු අතර, එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට බලපා ඇති බවත්, දැනට කාර්යාල කාර්යය සහායකයෙකු විසින් වරිපනම් රැස් කරන බවත්, රටේ පවතින තත්ත්වය ආදායම් අඩුවීමට බලපා ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ ආයතන 21 කින් රු. 55,109 ක හිඟ ශේෂයක් හා පෞද්ගලික ඒකක 2087 කින් රු. 1,468,620 ක් වශයෙන් ජල පාරිභෝගිකයින් 2108 කගෙන් අයවිය යුතු හිඟ ජල ගාස්තුව රු. 1,523,729 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ මුදල් සභාව වෙත අයකර ගැනීමේ කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට කටයුතු කරන බව. | සභාවට ලැබිය යුතු ආදායම් අප්‍රමාදය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කඩකාමර පරීක්ෂාව** | | |
| සභාවට අයත් පර්චස් 20 ක වපසරියකින් යුත් ව්‍යාපාරික වටිනාකමක් සහිත පෙළගෙවත්ත ඉඩමේ කට්ටි 09 ක් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා බදුකරුවන් 09 දෙනෙකුට 1995 වර්ෂයේ සිට බිම් බදු අයකිරීමේ පදනම මත ලබාදී තිබුණි. එම ඉඩම් සඳහා තක්සේරු වාර්තාවක් ලබා | පෙළගෙවත්ත ඉඩම සඳහා තක්සේරු වාර්තාවක් ඉල්ලා සිටියද, එක් එක් ඉඩම් කට්ටියට අයත් භූමි ප්‍රමාණය හඳුනාගත නොහැකි බැවින් තක්සේරු වාර්තාවක් ලබාදීමට නොහැකි වී ඇති බව. | දේපල අයිතිය තහවුරු කර ඉඩම් සඳහා තක්සේරු වාර්තාවක් ලබාගෙන ඒ අනුව බදුකුලී අයකිරීමට කටයුතු කළ යුතුය. |

ගැනීමට කටයුතු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වාරතාව නොලැබීම හේතුවෙන්, වාර්ෂිකව සියයට 10 බැගින් වැඩිකරමින් මාසික බදු මුදලක් අයකිරීමෙන් සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. එසේම එක් එක් ඉඩම් කට්ටියට අයත් භූමි ප්‍රමාණය පිළිබඳ තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 732 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 3,833,740 ක පිරිවැයක්, කාර්යය මණ්ඩල සේවකයින් 10 දෙනෙකු වෙනුවෙන් ද වාහන සහ යන්ත්‍ර උපකරණ 04 ක් වෙනුවෙන් රු. 980,490 ක පිරිවැයක් දරා තිබුණ ද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් බැහැරව භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දැමීම මඟින් පාරිසරික ගැටළු රාශියක් මතුවී තිබුණි. | කොම්පොස්ට් අංගනයේ ඉදිකිරීමේ කටයුතු අවසන් වූ වහාම කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන බව. | විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සැලසුම් කර එය පරිසර හිතකාමී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |